# තරඟකාරී පරිසරයක අන්තකර්රණ අධ්‍යාපනය



මෙම ප්‍රාථමික පාසලේ පළමු ශ්‍රේණියේ සිට පහ ශ්‍රේණිය දක්වා සමාන්තර පන්ති හත බැගින් ඇති අතර එක් පන්තියක සිසුන් 40දෙනෙක් ඉගෙනුම ලබති. උද්යෝගිමත් සිසුන්ගෙන් පිරී ඇති පන්තිකාමර සජීවී සහ සිත් ඇදගන්නා සුළුය. සියලුම සිසුන් ප්‍රබෝධවත් කෙරෙන ඉගෙනුම් පරිසරයක් සැපයීමට ගුරුවරු ඇප කැපවී සිටිති.

කොළඹ තදාසන්න ප්‍රදේශයක පිහිටා ඇති මෙම ප්‍රාථමික පාසලට දෙමාපියන්ගෙන් ඉහළ ඉල්ලුමක් ඇත. කීතරීමත් ද්විතීයික පාසල්වලට ප්‍රවේශ වීම සඳහා දොරටුවක් ලෙස ක්‍රියා කරන 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සඳහා සිසුන් සූදානම් කිරීම සම්බන්ධයෙන් මෙම පාසලට තිබෙන කීතරීය එහි ජනප්‍රියත්වයට හේතු වේ. සැම වසරකම සිසුන් 250ක් පමණ 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින අතර ඔවුන්ගෙන් ආසන්න වශයෙන් 100ක් පමණ ඉහළ පෙළේ ද්විතීයික පාසල්වලට ඇතුළත් වීමට සුදුසුකම් ලබති.

“මෙහි අධ්‍යයන පරිසරය ඉතා තරඟකාරීයි,” යි වැඩබලන විදුහල්පතිවරිය පැවසුවාය. "ස්වාභාවිකවම, දෙමව්පියන්ට අවශ්‍ය වන්නේ තම දරුවන්ට හොඳම දේ දෙන්නටයි."

පාසලේ උදේ වරුව තරම්ම පාසලෙන් පසු කාලයත් කායර්බහුල බව වැඩබලන විදුහල්පතිවරිය පෙන්වා දුන්නාය. "බොහෝ සිසුන් අමතර ඉගැන්වීම්, විෂය සමගාමී සහ විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා පාසලෙන් පසුව රැඳී සිටිනවා. අපගේ සියලුම සිසුන් තුළ කැපී පෙනෙන අධ්‍යයන සහ පෞරුෂ වධර්නයක් ඇති කිරීමට ඉහළින්ම කැප වී කටයුතු කරන අපගේ කායර් මණ්ඩලය ගැන අපට ආඩම්බරයි."

"අපි විශේෂ අධ්‍යාපන ඒකකයට උපරිම සහයෝගය ලබා දෙනවා. විශේෂ ඉගෙනුම් අවශ්‍යතා ඇති සිසුන්ට විෂය සමගාමී සහ විෂය බාහිර ක්‍රියාකාරකම් සියල්ලටම පාහේ සහභාගී වීමට අවස්ථාව ලබා දී තිබෙනවා. ඔවුන්ට උදැසන රැස්වීම්, විවිධ ප්‍රසංග, ක්‍රීඩා සහ වෙනත් ඉසව්වලට සහභාගී වීමට අවස්ථාව ලැබෙනවා," යි වැඩ බලන විදුහල්පතිනිය අවධාරණය කළාය.

පහ ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේ දැඩි තරගකාරීත්වය දරුවන්ගේ සාකල්‍ය සංවධර්නයට බාධාවක් වන බවට ශ්‍රී ලංකාව තුළ දිගු කලක සිට විවේචන එල්ල වෙමින් තිබේ. කෙසේ වෙතත්, එම ගැටලුව තවමත් විසඳී නැත. 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සඳහා පවතින දැඩි තරගකාරීත්වය විශේෂ අවශ්‍යතා ඇති සිසුන් සඳහා අමතර කාලයක් කැප කිරීමට අපේක්ෂා කරන ගුරුවරුන්ට අභියෝගයකි. ගුරුවරු දෛනික පාඩම් සකස් කිරීම සඳහා අමතර පැය ගණනක් නිරන්තරයෙන් කැප කරති. ඒ හේතුවෙන් විශේෂ අවශ්‍යතා ඇති සිසුන් සඳහා විශේෂයෙන් අමතර කාලයක් වෙන් කිරීම පහසු නැත.



මෑතදී පාසලට ඇතුළත් කරගන්නා ලද සිසුන් අතරින් විශේෂ අවශ්‍යතා ඇති සිසුන් දෙදෙනකු පසුගියදා හඳුනාගන්නා ලදි. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා පිළිබඳ තක්සේරු කිරීමෙන් පසුව, ඔවුන් අන්තකර්රණ අධ්‍යාපන වැඩසටහන් සඳහා සම්බන්ධ කරන ලදි. එක් සිසුවෙකුට ගුරු සහායකයකුගේ සහාය ඇතිව සාමාන්‍ය පන්ති කාමරයේ ඉගෙනීමට නිදෙර්ශ කරන ලදී. පාසල කැමැත්තෙන්ම එම දරුවාගේ අවශ්‍යතාවට ඉඩ සලසා දී ඇත.

"අහම්බෙන් වගේ, විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය ප්‍රධාන විෂයයක් ලෙස හදාරන විවෘත විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක සිසුවියක් අපේ පාසලට සීමාවාසික පුහුණුවක් සඳහා අනුයුක්ත කළා. උපාධිය ලැබීමත් සමඟ ඇය මේ සිසුවාගේ ගුරු සහායකවරියක් ලෙස දිගටම සේවය කිරීමට එකඟ වුණා. ඇයගේ වියදම් සිසුවියගේ දෙමාපියන් විසින් දරනවා," යි වැඩබලන විදුහල්පතිනිය පැහැදිලි කළාය.

විශේෂ අධ්‍යාපන සිසුන්ගේ පහසුව සඳහා විශේෂ අධ්‍යාපන ඒකකය ස්ථානගත කර තිබෙන්නේ පාසලේ පැති ගේට්ටුවක් අසලය. එම ගේට්ටුව අසල අතුරු මාගර්යකට විවෘත වන අතර, අවශ්‍ය නම් විශේෂ අධ්‍යාපන ඒකකයේ දොරකඩටම වාහනවලින් පැමිණිය හැකිය. පාසල් යටිතල පහසුකම් සංවධර්නය සඳහා පාසල් ප්‍රජාවගේ සහයෝගය පරිපාලනය විසින් සාථර්කව සම්බන්ධීකරණය කර ඇත.

“ඇවිදීමේ අපහසුතා ඇති එක් සිසුවෙකු සෑම දිනකම ඔහුගේ දෙමාපියන් විසින් පාසලට රැගෙන එනවා. දරුවාට සාමාන්‍ය පුටුවක වාඩි විය නොහැකි නිසා පාසල විසින් ඔහුට පාසල් ප්‍රජාවගේ සහයෝගය ඇතිව නිමර්ාණය කරන ලද විශේෂ පුටුවක් ලබා දී තිබෙනවා,” යි පාසල් සංවධර්න මණ්ඩලයේ ලේකම්වරයා පැවසීය.

"විශේෂ අධ්‍යාපන ඒකකයේ පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා විවිධ ව්‍යාපෘති හරහා අධ්‍යාපන දෙපාතර්මේන්තුවෙන් අප සහයෝගය ලබාගත්තා. ඔවුන්ට දැන් පහසුකම් සහිත යාබද වැසිකිළියක් සහ දුබලතා සහිත සිසුන්ට පහසුවෙන් පරිහරණය කිරීමට හැකි පරිදි ප්‍රවේශ පහසුකම් තිබෙනවා," යි පාසලේ අන්තකර්රණ අධ්‍යාපන සම්බන්ධීකාරකවරිය වැඩිදුරටත් පැවසුවාය.

චිත්‍ර ඇඳීම, ගායනය, නැටුම් සහ අකුරු සහ ඉලක්කම් ඉගෙනීම ඇතුළු විවිධ ක්‍රියාකාරකම්වල යෙදෙන සිසුන් අපි නිරීක්ෂණය කළෙමු. බොත්තම් දැමීම සහ බොත්තම් ගැලවීම, කොණ්ඩය පීරීම, පිළිවෙලට අවට පරිසරය පවත්වා ගැනීම, ඉවුම් පිහුම් කටයුතු සඳහා සහාය වීම සහ රෙදි සේදීම, වියළීම සහ ඇසිරීම වැනි අත්‍යවශ්‍ය දෛනික ජීවන කුසලතා පිළිබඳ පුහුණුවක් ද ඔවුන්ට පාසලෙන් ලැබේ.

මෙම පාසලේ විශේෂ අධ්‍යාපන ඒකකය පාසල් පරිපාලනයේ සහ ප්‍රජාවගේ සහයෝගය මත සාර්ථක අන්දමින් ක්‍රියාත්මක වේ. අන්තකර්රණ අධ්‍යාපනය සඳහා පාසලේ කැපවීම නිසා සියලුම සිසුන්ට ඉගෙනීමට, සංවර්ධනය වීමට සහ ඔවුන්ගේ සම්පූර්ණ හැකියාවන් කරා ළඟා වීමට අවස්ථාව ඇති බව තහවුරු වේ. ශ්‍රී ලංකාවේ ඇතැම් ජනප්‍රිය පාසල් තවමත් පවතින්නේ දැඩි තරගකාරී පරිසරයක ය. කෙසේ වෙතත්, මෙම පාසල වැනි පාසල් විශේෂ අධ්‍යාපන අංශයේ සහයෝගය ඇතිව සියලුම දරුවන් අන්තකර්රණයට යොමු කිරීමට උත්සාහ කිරීම බෙහෙවින් පැසසිය යුතු වේ.